# (එ) මිල සහ වැටුප්

## 1. මිල

ශ්‍රී ලංකාවේ මිල චලනයන්හි ප්‍රධාන නිර්නායකය කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය වුවද, පසුගිය වාර්ෂික වාර්තාවන්හි පෙන්වාදී ඇති දුර්වලතාවන්ට අනුව විශ්වාසදායක දර්ශකයක් වශයෙන් එහි ඇති ප්‍රයෝජනවත්කම විකෘතවී ඇති බව පෙනේ.[1]

කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව පාරිභෝගික මිලෙහි වාර්ෂික සාමාන්‍යය, 1972 දී සියයට 6·3 කින් වූ වැඩිවීම හා සසඳන කල, 1973 දී එය සියයට 9·7 කින් වැඩිවී ඇත. 1973 ජනවාරි, ජූනි, අගෝස්තු සහ ඔක්තෝබර් යන මාසවල දර්ශකය පිළිවෙලින් සියයට 2·3 කින්, 2·9 කින් 1.8 කින් සහ 2·7 කින් වැඩිවීම, මෙයට ප්‍රධාන හේතුවයි. 1973 අනිකුත් මාසවල දර්ශකයේ වැඩිවීම සාමාන්‍යයෙන් සියයට 0·5 කි.

1973 මිලෙහි තියුණු වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, තිරිඟු පිටි, ඉන්ධන, රෙදිපිළි, කිරි ආහාර, කුළු බඩු, පොල්, බීත්තර වැනි ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල මිල වැඩිවීමයි. අත්‍යාවශ්‍ය ආනයන භාණ්ඩවල මිල තියුණු ලෙස වැඩි වූයේ ලෝක වෙළෙඳ පලේ මෙම භාණ්ඩවල පැවැති හිඟයන් නිසාය. ලොව පුරා පැවැති උද්ධමනකාරි ප්‍රවණතාවන් සහ නැව ගාස්තු වැඩිවීම නිසා 1973 වසරේදී මිල ගණන් ඉහළ යෑමේ පීඩනයක් නිරන්තරවම දක්නට ලැබුණි. දේශීය මිල ගණන් ඉහළ යෑමෙහිලා අන්තර් ජාතික බලශක්ති අර්බුදය මගින් සැලකිය යුතු බලපෑමක් එකතු කළේය. මෙකී සාධක මගින් බොහෝ භාණ්ඩවල මිල ගණන් මත පැතිරී ගිය බලපෑමක් ඇති කළේය.

1973 නොවැම්බර් 1 වැනි දින සිට ව්‍යාපාර පිරිවැටුම් බදු ක්ෂෙත්‍රය විශාල කර මෙතෙක් එම බද්දෙන් නිදහස් කර තිබුණු සමහර භාණ්ඩයන් මෙම බද්දට යටත් කර ඇත. 1972 වසරේ පසු භාගයේදී විදේශීය විනිමය සහතික පත්‍රයන්හි මිල වැඩි කිරීමෙහිත්, ව්‍යාපාරික පිරිවැටුම් බද්දෙහි ක්ෂෙත්‍රය පුළුල් කිරීමෙහිත් සම්පූර්ණ බලපෑම 1973 දී ඇති විය. 1973 ජූනි, ජූලි සහ අගෝස්තු යන මාසවල මුදල් සැපයුමෙහි වූ තියුණු ඉහළ යෑමද මෙම තත්ත්වයෙහිලා දායක වූවා විය හැක.

1973 දී සහල්, තිරිඟු පිටි, සීනි, උම්බලකඩ සහ පරිප්පු යනාදීන්හි සලාක ක්‍රමයෙහි වැදගත් වෙනස්වීම් සිදුවී ඇත. 1973 ඔක්තෝබර් මාසයේ මුල සිට පළමුවන වරට තිරිඟු පිටි සලාක ක්‍රමයට නිකුත් කරන ලදී. ඉහළ ගිය ආනයන වියදම් හෝ නිෂ්පාදන වියදම් වැඩිවීම සැළකිල්ලට ගෙන මිල ගණන් වැඩිකල නමුදු, අත්‍යාවශ්‍යභාණ්ඩ බොහොමයක් සම්බන්ධයෙන් වූ පවත්නා මිල පාලනයන් නොවෙනස්ව පැවතිණ. මෙම වර්ගයට අඩංගුවූ ප්‍රධාන ශීර්ෂයන් වූයේ සමහර කිරි ආහාර, ලංකාලෝහ උදලු, සමහර වර්ගවල ෆෝමික් ඇසිඩ, ඇස්බැස්ටෝස් තහඩු, කුඩ සහ සිමෙන්තිය. කෙසේ වුවද, සැටින් රෙදි, සබන් යනාදී භාණ්ඩ කිහිපයක් මිල පාලනයෙන් ඉවත් කරන ලද අතර, සමහර වර්ගවල ළදරු කිරි ආහාර, ෆෝමික් ඇසිඩ වර්ගයක් සහ කෘත්‍රිම රෙදිවලින් සෑදූ කමිස 1973 දී මිල පාලනයන්ට යටත් කරන ලදී.

---

1. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ඇති ප්‍රධාන අඩුපාඩුකම් මෙවාය: –

(අ) කොළඹ නගරයේ සාමාන්‍ය කම්කරු පංතියේ පවුලක ජීවන වියදමෙහි වෙනස්වීම මිනීම සඳහා මෙම දර්ශකය සකසා ඇති හෙයින්, මිල ප්‍රමාණයන්හි සාමාන්‍ය මට්ටමෙහි ඇතිවන වෙනස්කම් මිනීම සඳහා එය ප්‍රමාණවත් නොවේ.

(ආ) හුඅදක් කම්කරු පංතියේ පාරිභෝජන රටාවෙහි සැලකිය යුතු වෙනස්කම් ඇතිවී තිබියදීත්, 1952 ට පසුව දර්ශකයෙහි නොයෙක් අංශයන්හි බර ප්‍රතිශෝධනය කර නොමැත.

(ඇ) සමහර භාණ්ඩවල හිඟකම හෝ පරිභෝජන රටාවෙහි අනපේක්ෂිතවෙනස්කම් නිසා පරිභෝජන ප්‍රමාණයෙහි සිදුවිය හැකි අඩුවීම් සඳහා දර්ශකයේ වටිනාකම් පිළිබඳ බර තැබීම් කලින් කලට වෙනස් කර ඇත. මෙවැනි වෙනස්කම් නිසා දර්ශකයට අත්තනෝමතික මූලයක් ඇතුළත් වෙයි.

(ඇ) හිඟකම් හේතුකොට ගෙන ඇතිවූ භාණ්ඩ සැපයුමෙහි උච්චාවචනයක් නිසා විවෘත හා පාලන වෙළෙඳ පොලවල පවත්නා මිල ප්‍රමාණයන්හි සාපේක්ෂිත වැදගත්කම කෙරෙහි ප්‍රමාණවත් පරිදි සැලකිල්ල යොමු නොකිරීම.

## (අ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය

කලින් සඳහන් කළ පරිදි 1972 දී සියයට 6·3 කින් වැඩිවූ කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය 1973 දී සියයට 9·7 කින් වැඩි විය. උපදර්ශක; රෙදි සම්බන්ධයෙන් සියයට 14·0 කින්ද, ඉන්ධන හා එළිය සියයට 12·7 කින්ද, ආහාර සියයට 11·7 කින්ද, විවිධ භාණ්ඩ සියයට 0·3 කින්ද වැඩි විය. 1972 දී මෙම භාණ්ඩයන්ගේ අනුරූප වැඩිවීම් පිළිවෙලින් සියයට 12·8 ක්ද, 3·6 ක්ද, 6·0 ක්ද, සහ 6·2 ක්ද විය.

මුළු දර්ශකයෙහි වැඩිම බර තැබුමක් (සියයට 61·9ක) ඇති ආහාර සඳහා වූ ගණයෙහි උප දර්ශකය 1973 ජනවාරි, ජූනි සහ ඔක්තෝබර් යන මාසවලදී පිළිවෙලින් සියයට 2·7, 4·7 සහ 4·0 කින් තියුණු ලෙස වැඩිවුන අතර වසරේ අනිකුත් මාසවලදී එම දර්ශකයෙහි සාමාන්‍ය මාසික වැඩිවීම සියයට 0·8 ක් විය. උපදර්ශකයෙහි වූ මෙම සැලකිය යුතු වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍යයන් වන තිරිඟු පිටි, සීනි, වෙඩරු, කුළුබඩු, ඇට වර්ග සහ අනිකුත් කුළු බඩුවල මිළ ඉහළ යාමය. 1973 දී නොමිලේ දෙන ලද සහල් සලාකය, සේරුවේ සිට සේරු බාගය දක්වා අඩු කළ අතර, සලාකයේ දෙවන සේරුවෙහි මිළ රු. 1.00 සිට රු. 1.60 දක්වා වැඩිකර, අවසානයේදී එය රු. 1.40 දක්වා අඩු කරන ලදී. 1973 දී ප්‍රථම වරට, තිරිඟු පිටි සලාක ක්‍රමයට යටත් කොට අවස්ථා තුනකදී එහි මිළ රාත්තලකට ශත 33 සිට ශත 70 දක්වා වැඩි කරන ලදී. මෙම වෙනස්වීම් වලට සමාන්තරව පාන්වල මිළ රාත්තලකට ශත 34 සිට ශත 76 දක්වා වැඩිවුන අතර සීමිත ප්‍රමාණයක් පමණක් ලබාගත හැකි විය.

### II (ඒ) 1 සංඛ්‍යා සටහන

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

(පාදය 1952 = 100)

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| බරතැබුම | 100·0 | 61·9 | 9·4 | 4·3 | 5·7 | 18·7 | 60·0 | 35·0 | 5·0 |
| 1969 සාමාන්‍යය | 130·5 | 127·9 | 130·9 | 124·9 | 108·4 | 147·1 | 134·2 | 123·6 | 148·2 |
| 1970 සාමාන්‍යය | 138·2 | 136·6 | 137·3 | 136·1 | 109·8 | 153·2 | 142·9 | 129·3 | 157·3 |
| 1971 සාමාන්‍යය | 141·9 | 139·1 | 145 0 | 140·8 | 109·8 | 159·5 | 148·9 | 129·7 | 157·9 |
| 1972 සාමාන්‍යය | 150·8 | 147·5 | 163·4 | 145·9 | 109·8 | 169·4 | 161·6 | 136·1 | 140·6 |
| 1 වන කාර්තුව | 148·1 | 144·8 | 154·2 | 142·8 | 109·8 | 168·9 | 157·7 | 133·9 | 147·2 |
| 2 වන කාර්තුව | 150·3 | 147·0 | 160·1 | 146·4 | 109·8 | 169·3 | 160·8 | 135·3 | 143·6 |
| 3 වන කාර්තුව | 152·2 | 148·8 | 168·2 | 146·4 | 109·8 | 169·5 | 164·0 | 137·2 | 128·8 |
| 4 වන කාර්තුව | 153·0 | 149·4 | 171·4 | 148·0 | 109·8 | 170·2 | 164·C | 137·8 | 143·0 |
| 1973 සාමාන්‍යය | 165·4 | 164·8 | 186·1 | 164·4 | 109·8 | 170·0 | 167·8 | 162·5 | 171·9 |
| 1 වන කාර්තුව | 157·7 | 155·5 | 181·6 | 155·4 | 109·8 | 168·7 | 164·6 | 148·3 | 159·0 |
| 2 වන කාර්තුව | 161·4 | 160·7 | 181·6 | 155·4 | 109·8 | 170·4 | 165·8 | 154·6 | 170·4 |
| 3 වන කාර්තුව | 167·8 | 169·3 | 188·7 | 167·5 | 109·8 | 170·4 | 169·8 | 166·1 | 171·6 |
| 4 වන කාර්තුව | 174·8 | 179·3 | 192·3 | 179·2 | 109·8 | 169·8 | 171·2 | 181·2 | 186·6 |
| ප්‍රතිශත වෙනස | | | | | | | | | |
| 1971 ට වඩා 1972 | 6·3 | 6·0 | 12·8 | 3·6 | 0·0 | 6·2 | 8·5 | 4·9 | – 11·0 |
| 1972 ට වඩා 1973 | 9·7 | 11·7 | 14·0 | 12·7 | 0 0 | 0·3 | 3·8 | 19·4 | 22·3 |

මූලය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව

මිළ වැඩිවූ අනිකුත් ප්‍රධාන භාණ්ඩය වූයේ සීනිය. සලාකයට නිකුත් කළ රාත්තල ශත 72 බැගින්වූ සීනි, මාසයකට එක් අයකුට දෙනු ලැබූ රාත්තල් 2 සිට රාත්තල ½ දක්වා අඩු කරන ලදී. සලාකයෙන් පිට දෙනු ලැබූ සීනි රාත්තල කලින් පැවැති මිළවූ 1.50 සිට රුපියල් 2.00 දක්වා වැඩි කරන ලදී. දේශීය නිෂ්පාදනය අඩුවීම හේතුකොට ගෙන පොල් සහ පොල් තෙල්වල මිළද තියුණු ලෙස වැඩිවිය. 1973 මැයි 26 දින සිට කිරි සහ ටින් කිරිවල මිළ වැඩි කරන ලදී. තවද, කුකුල් කෑමවල මිළ වැඩිවීම නිසා බිත්තරවල මිළ ඉහළ ගියේය. තේ, කෝපි, ලුණු, දෙහි, ජෑම් සහ විස්කෝතුවලද මිළ කැපී පෙනෙන ලෙස වැඩිවිය.

1972 සිදුවූ පරිදිම 1973 හිදිද රෙදිපිළි සඳහා වූ උපදර්ශකය අනිකුත් උපදර්ශකයන් අතරින් විශාලතම සියයට වැඩිවීමක් පෙන්නුම් කළේය. 1972 දී වූ සියයට 12·8 ක වැඩිවීමකට එරෙහිව 1973 දී වූ වැඩිවීම සියයට 14·0 ක් විය.

ඉන්ධන හා එළිය සඳහා වූ උපදර්ශකයෙහි 1972 වසරේ වූ සියයට 3·6 ක වැඩිවීමක් හා සසඳන කල්හි 1973 දී එහි සියයට 12·7 ක වැඩිවීමක් සටහන් විය. මෙයින් වැඩි ප්‍රමාණයක්ම සිදුවූයේ 1972 දෙසැම්බර් 31 වැනි දින හා 1973 අගෝස්තු 24 වැනි දිනයන්හිදී භූමි තෙල් මිළ ගණන්හි වූ ඉහළ ප්‍රතිශෝධනයන් හේතුකොට ගෙනය. මේ අතර 1973 අගෝස්තු මාසයේදී දරවල මිළෙහිද වැඩිවීමක් විය.

ශෙවල් කුලී සඳහා වූ උපදර්ශකය 1973 දී නොවෙනස්ව පැවතිණි.

1972 දී සියයට 6·2 කින් වැඩිවූ විවිධ භාණ්ඩ උපදර්ශකය 1973 දී වැඩි වූයේ, සියයට 0·3 කින් පමණි. උපදර්ශකයෙහි සාමාන්‍ය වාර්ෂික වැඩිවීම සමහන් කිරීමෙහිලා දුම්කොළ බද්දෙහි අඩුවීම බොහෝ දුරට හේතු විය. 1973 මාර්තු මාසයේදී සබන් සඳහා වූ පාලන මිළ සියයට 20 කින් පමණ වැඩි කරන ලදී. තවද, එම හේතුවම නිසා ඔක්තෝබර් හා නොවැම්බර් යන මාසයන්හි මිළ පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 8 කින් වැඩි කරමින්, 1973 ඔක්තෝබර් 1 වැනිද සබන් මිළ පාලනයෙන් ඉවත් කරන ලදී.

### (ආ) කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් බාහිර මිළ ගණන්

කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් දැක්වුනු ශීර්ෂයන්ගේ මිළ ගණන් වලට අමතරව මහ බැංකුව විසින් සීමිත භාණ්ඩ සංඛ්‍යාවක මිළ ගණන් එකතු කර ඇත. මෙවා ලබාගන්නා ලද්දේ කොළඹ නගරයේ සිල්ලර වෙළඳුන් වෙතින් කෙලින්ම විමසීමෙනි. පල කර ඇති වෙළඳ මිළ ලැයිස්තුද මෙම කාර්යය සඳහා උපයෝගී කර ගන්නා ලදී. මෙම ශීර්ෂයන් සවිස්තරව විශ්ලේෂණය කිරීම සඳහා පුළුල් වශයෙන් පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යනුවෙන් වර්ග කරනු ලැබේ.

1972 වසර අවසානයේ සිට 1973 වසර අවසානය දක්වා තෝරා ගත් ශීර්ෂයන්හි මිළ ගණන්වල ප්‍රතිශතයේ වෙනස්වීම II (ඒ) 2 සංඛ්‍යා සටහනින් දක්වෙයි. භාණ්ඩ පංතීන්හි මිළ චලනයන් දක්වන දළ නිර්නායකයන් වශයෙන් මෙය සැළකිය යුතුයි.

### පාරිභෝගික භාණ්ඩ

කොළඹ නගරයේ තම්බාපු සහල්වල විවෘත වෙළෙඳපල මිලෙහි වාර්ෂික වැඩිවීමේ සාමාන්‍යය සියයට 50 ත්, සියයට 55 ත් අතර වෙනස් වෙමින් පැවතුනි. 1973 මුල් කාර්තු තුන තුළ සහල්වල සාමාන්‍ය මිළ 1972 එම කාර්තු සමග සසඳන කළ, සියයට 18 කින් වැඩි විය. කෙසේ වුවද, 1973 අවසාන කාර්තුවේදී එම වැඩිවීම, සියයට 155 ක් පමණ වී ඇති බව පෙනේ. මෙකී මිළ වැඩිවීම, සහල් සලාකය සහ තිරිඟු පිටි සලාකය මගින් පොළඹවන ලද විවෘත වෙළඳ පල මිළ සඳහා වූ වැඩිවුනු ඉල්ලුම හේතුකොට ගෙන සිදුවිය.

අනිකුත් පාරිභෝගික භාණ්ඩයන්හි මිළ වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ, ආනයනය කරන්නාවූ අමු ද්‍රව්‍යයන්හි මිළ වැඩිවීම, අධික නැව් ගාස්තු සහ වැටුප් වැඩිවීමය. තවද 1972 අග කොටසෙහි ඇතිවූ විදේශ විනිමය හිමිකම් සහතික පත්වල මිළ වැඩිවීමෙහි සහ ව්‍යාපාර පිරිවැටුම් බදු වැඩිවීමෙහි මුළු බලපෑම 1973 වසරේදී දැකිය හැකි විය.

## II (එ) 2 සංඛ්‍යා සටහන

## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් බාහිර මිල*

| ද්‍රව්‍යයේ ස්වභාවය | ප්‍රතිශත වෙනස 1973/72 |
|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | |
| තම්බාපු සහල් | + 50 සිට 55 |
| ටින් කළ මාළු | + 30 |
| ජෑම්, ජෙලි, සෝස් සහ කෝඩියල් | + 7 සිට 51 |
| දන්තාලේප | + 23 |
| වැල්කම් පූයර | + 44 සිට 76 |
| ඔඩිකොලෝන් | + 15 සිට 40 |
| කමිස | + 21 සිට 50 |
| ඉටිපන්දම් | + 22 |
| මිශ්‍ර සම් භාණ්ඩ | + 5 |
| විදුලි පන්දම් සහ ට්‍රාන්සිස්ටර් බැටරි | + 9 සිට 20 |
| විදුලි පංකා | + 16 |
| මහන මැසින් | + 13 සිට 27 |
| විදුලි බුබුළු | + 15 |
| විදුලි සවි කිරීම් (ප්‍රධාන වශයෙන් කේබල් කම්බි) | + 26 සිට 49 |
| මෝටර් රථ අමතර කොටස් | + 2 සිට 62 |
| කාර් බැටරි | + 47 සිට 52 |
| **අන්තර් භාණ්ඩ** | |
| කඩදාසි | + 21 සිට 25 |
| පැට්‍රල් | + 14 සිට 15 |
| තඹ කම්බි | + 40 සිට 67 |
| සෝඩා අළු | + 22 |
| කෝස්ටික් සෝඩා | + 4 |
| **ආයෝජන භාණ්ඩ** | |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | |
| 1. පාදස්ථල සහිත මුහුණ සෝදන බේසම (22"X16") මෙරට | + 29 |
| පාදස්ථල රහිත මුහුණ සෝදන බේසම ( එම ) මෙරට | + 1 |
| 2. පහත් වැසිකිළි බඳුන්—මෙරට | + 22 |
| 3. මැටි පයිප්ප (2"X4") එංගලන්තයේ සාදන ලද | + 15 |
| උදළු තල | + 45 |
| ලංකා ලෝහ පොරෝ | + 16 |
| පදම්නොකළ වානේ | + 12 සිට 28 |
| සරනේරු | + 8 සිට 21 |
| මෝට්ස් දෙර අගුළු | + 14 |
| ඔටෝ කේබල් | + 30 සිට 50 |
| ප්ලැව් වුවින් | + 20 සිට 54 |
| රබර් යන්ත්‍ර | + 5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* ඒ ඒ භාණ්ඩයන් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශත වෙනස්වීම අන්තරයෙන් නියෝජනය කැරෙන ශීර්ෂයන්ගේ අඩුම හා ඉහළම ප්‍රතිශත වෙනස්වීම දක්වයි.

**අන්තර් භාණ්ඩ**

විදේශ විනිමය හිමිකම් සහතික පත්වල මිළ ඉහළ යාම කඩදාසිවල මිළ වැඩි වීමට තරමක් දුරට හේතු විය. තවද, 1973 දී ලොව පුරා පැවති කඩදාසි හිඟය නිසා එහි මිළ තියුණු ලෙසින් ඉහළ ගියේය. ඉහළ නිෂ්පාදන පිරිවැය මෙරට නිෂ්පාදිත අන්තර් භාණ්ඩවල මිළ ගණන් ඉහළ යාමට ප්‍රධාන හේතුව විය. 1973 අගෝස්තු 24 වෙනි දින සිට සුපිරි පැට්‍රල් ගැලුමක මිළ රුපියල් 5.75 සිට රුපියල් 6.50 දක්වාත්, සාමාන්‍ය පැට්‍රල් ගැලුමක මිළ රුපියල් 5.30 සිට රුපියල් 6·10 දක්වාත් සංශෝධනය කරන ලදී. ආනයනය කරන්නාවූ අමු තෙල්වල මිළ ඉහළ යාම සහ නැව් ගාස්තු ඉහළ යාම මෙයට ප්‍රධාන හේතූන් විය.

**ආයෝජන භාණ්ඩ**

1973 දී ලංකා වානේ සංස්ථාවේ නිෂ්පාදිත භාණ්ඩ බොහොමයක මිළ සැලකිය යුතු අන්දමින් වැඩි විය. දේශීය නිෂ්පාදනයට සාතුබල සැපයීම් වශ් 1973 දී ආනයනය කරන ලද උදලු තලවල මිළ, මිළ පාලනයෙන් ඉවත් කරන ලදී. අමු ද්‍රව්‍ය මිළවැඩිවීම සහ නිෂ්පාදන වියදම් වැඩිවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ බොහොමයකම මිළ වැඩි විය.

**(ඇ) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩයන්ගේ තොග මිළ.**

1973 දී මෙරට නිෂ්පාදිත භාණ්ඩයන්ගේ තොග මිළ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් කරන ලද විමසීම්වලදී, නිෂ්පාදකයන්ගෙන් සතුටුදායක අනුකූල තාවයක් ලැබිණි. මෙම අධ්‍යයනය යටතට ගැනෙන නියෝජනාත්මක ශීර්ෂ කිහිපයක් සඳහා වූ මිළ චලනයන් II (එ) 3 සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කෙරේ. මෙම මිළ ගණන් නිෂ්පාදක යන්ගේ හා ඔවුන්ගේ එකම ඒජන්තවරුන් විසින් ඉදිරිපත් කළ මිළ ගණන් වන අතර, තොග බෙද හරින්නන් විසින් ඒ ඒ අවස්ථාවන්හි අය කරන්නා වූ ආන්තිකයන් මෙකී මිළ ගණන්හි ඇතුළත් නොවේ.

ඖෂධ, දුම්කොළ සහ සමහර වර්ගයන්හි රෙදිපිළිවල හැර අනිකුත් සියළු භාණ්ඩයන්හි තොග මිළ තරමක් දුරට වැඩි විය. මෙම වැඩිවීම් වලට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයනය කළ අමු ද්‍රව්‍යවල මිළ ඉහළ යාම, ව්‍යාපාරික පිරිවැටුම් බද්ද වැඩි කිරීම සහ වැටුප් වැඩි කිරීමය.

සිගරට් සහ දුම්කොළවල තොග මිළ අඩු වූයේ, දුම්කොළ සඳහා වූ බද්ද අඩු කිරීමේ හේතුවෙන් ය තවද, කෘතිම රෙදිපිළි පිළිබඳව වූ ව්‍යාපාරික පිරිවැටුම් බද්ද අඩු කිරීමේ හේතු වෙන් සමහර වර්ගයන්හි කෘතිම රෙදිපිළිවල තොග මිළ අඩු විය. වසර තුළදී, මිළ පාලන යන්ගේ හේතුවෙන් වැඩි ඉල්ලුමක් ඇති සමහර ඖෂධයන්ගේ තොග මිළ වෙනස් නොවිණි.

## II (එ) 3 සංඛ්‍යා සටහන

### තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

| | ඒකක | 1972 කම්හල් මිල රු. ශ. | 1973 කම්හල් මිල රු. ශ. | 1973/72 වෙනසේ සියයට ගණන |
|---|---|---|---|---|
| **1· ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ** | | | | |
| බිස්කට් ( ක්‍රීම් ක්‍රැකර්ස්) .. .. | වීන් | 6·32 | 7·67 | + 21 |
| පිටිකිරි (ලක්ස්ප්‍රේ) .. .. | රා. 1 වීන් | 2·98 | 3·99 | + 34 |
| උකුකිරි .. .. | අඩු. 14 වීන් | 1·15 | 1·65 | + 43 |
| - එර .. .. | රා. 1 | 5·40 | 5·40 | – |
| සිසිල් බීම (පෝටෙලෝ) .. .. .. | බෝතල් | 0·40 | 0·42 | + 5 |
| සිසිල් බීම (සෝඩා) .. .. .. | ,, | 0·20 | 0·22 | + 10 |
| රස පානය (පැෂෝනා) .. .. .. | ,, | 5·00 | 5·60 | + 12 |
| රස පානය (ඔරෙන්ජ්) .. .. | ,, | 5·25 | 6·00 | + 14 |
| දුම්කොල (අයිලන්ඩ ප්‍රයිඩ) . .. | රාත්තලක් | 61·10 | 56·45 | – 8 |
| සිගරට් (ත්‍රිරෝසස්) .. .. | දහසක් | 148·85 | 139·55 | – 7 |
| **2· රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්** | | | | |
| රෙදි (එල්·ඩී·එම·) සුදු .. .. .. | යාරයක් | 2·40 | 2·85 | + 19 |
| රෙදි (එල්·ඩී·එම·) වර්ණවත් .. .. | ,, | 2·50 | 3·35 | + 34 |
| පොප්ලින් – සුදු .. .. .. | ,, | 2·75 | 3·65 | + 33 |
| වොයිල් – සුදු .. .. .. | ,, | 2·25 | 2·90 | + 29 |
| නොපිරූ නූල් – 30 ගණන් පට .. .. | රා. 1 ක් | 5·20 | 7·20 | + 38 |
| පැබරික් සාරි (මුද්‍රිත ෆෙදර් ජෝජට්ස්) 44''/45'' .. | යාරයක් | 10·50 | 9·33 | – 11 |
| සාරි (සී සිල්ක්) 44''/45'' .. .. | ,, | 8·80 | 10·46 | + 19 |
| කමිස රෙදි (ටෙට්රොලීන් පොලිස්ටර්) 35''/36'' .. | ,, | 15·00 | 15·00 | – |
| කමිස රෙදි (සී සිල්ක් සිල්ව ලයින්) 35''/36'' .. | ,, | 12·50 | 11·50 | – 8 |
| පැබරික් ඇඳුම් (නයිලෝන් සැටින්) 35''/36'' .. | ,, | 10·25 | 9·00 | – 12 |
| ඇඳුම් කට්ටල රෙදි (සී සිල්ක් කපිතාන්) 25''/28'' .. | ,, | 18·50 | 22·33 | + 21 |
| **3· ඖෂධ සහ පවිත්‍රතා භාණ්ඩ** | | | | |
| ඇස්ප්‍රින් පෙති පි. බී. (5 ග්‍රෙන්ස්) .. .. | දහසක් | 6·75 | 6·75 | — |
| සී. බී. පෙති (විටමින් සී සහ බී මිශ්‍ර පෙති) .. | ,, | 62·70 | 62·70 | — |
| ටෙරමයිසින් (කෝෂ) .. .. .. | බෝ 1(කෝ 100 | 69·50 | 69·50 | — |
| ඔබරොන් කෝෂ .. .. .. | බෝ 1(කෝ 30) | 6·61 | 6·61 | — |
| ඩියුරොල් .. .. .. | බෝ 1 | 4·05 | 4·05 | — |
| වෝටබරිස් විටමින් ටොනික් .. .. | බෝ 1 (අවු. 6) | 3·47 | 3·47 | — |
| පෙනිසිලින් 'වී' ඩියුමෙක්ස් .. .. | බෝ 1 | 64·00 | 64·00 | — |
| කෝස්ටික් සෝඩා .. .. .. | බෝ (පෙ.500) | 1836·80 | 2,038·40 | + 11 |
| ක්ලෝරින් දියර .. .. .. | ටොන් | 2531·20 | 2,755·20 | + 9 |
| කැල්සියම් ක්ලෝරයිඩ .. .. .. | ,, | 1232·00 | 1,500·00 | + 22 |
| **4· ගෘහ භාණ්ඩ සහ ගෙවල සවිකරන භාණ්ඩ** | | | | |
| කාර්යාල අල්මාරි (වානේ) .. .. | 1 | 495·00 | 575·00 | + 16 |
| ලිපිගොනු අල්මාරි (වානේ) .. .. | 1 | 545·00 | 590·00 | + 8 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72''/36'' සම්මත ප්‍රමාණය) .. | 1 | 112·00 | 140·25 | + 25 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72''/48'' විශේෂ) .. | 1 | 164·00 | 182·75 | + 11 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72''/60'' අති විශේෂ) .. | 1 | 236·00 | 289·00 | + 22 |
| ආවරනය නොකරන ලද මෙට්ට 2'' .. .. | ව. අඩි | 2·60 | 3·61 | + 39 |

(මතුපිට සම්බන්ධයි)

II (එ) 3 සංඛ්‍යා සටහන (සම්බන්ධය)

## තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

| | ඒකක | 1972 කම්හල් මිල රු. ශ. | 1973 කම්හල් මිල රු. ශ. | 1973/72 වෙනසේ සියයට ගණන |
|---|---|---|---|---|
| **5· ලෝහ භාණ්ඩ සහ විද්‍යුත් භාණ්ඩ** | | | | |
| වානේ, මෘදු වානේ රවුම් ⅜'' | මෙට්‍රික් ටො. 1 | 1930·00 | 2470·00 | + 28 |
| වානේ-මෘදු වානේ සමකෝණ 1X1X⅛ | ,, | 1980·00 | 2535·00 | + 28 |
| කලු බැඳුම් කම්බි (5·6 මි. මී) | ,, | 2135·00 | 2790·00 | + 31 |
| කටු කම්බි | රා. 56 | 57·25 | 80·50 | + 41 |
| උළුඑ තල (ලංකාලෝහ) | 1 | 12·00 | 17·05 | + 42 |
| සෘජු ගල් කටු (ලංකාලෝහ) | 1 | 18·00 | 21·69 | + 21 |
| කම්බි ඇණ (5·6 මි. මී.) | මෙට්‍රික් ටො. 1 | 2135·00 | 2695·00 | + 26 |
| පරිවෘත හා වැස්ම සහිත පී. වී. සී. කේබල් 1/044 | යාර 100 ක් | 31·58 | 36·60 | + 16 |
| ඔටෝ කේබල් 35/012 | අඩි 100 ක් | 23·59 | 26 85 | + 14 |
| සාමාන්‍ය විදුලි සේවා ලාම්පු (වො. 25) | 1 | 2·07 | 2·39 | + 15 |
| විශේෂ ලාම්පු (වො. 15) | 1 | 2·15 | 2·48 | + 15 |
| තද ආලෝක බල්බ (වො. 60) | 1 | 2·30 | 2·65 | + 15 |
| **6· කාර්මික, වාණිජ හා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ටයර් හා ටියුබ** | | | | |
| බයිසිකල් ටයර් 28''x1½'' (ලෝටස්) | 1 | 7·45 | 9·00 | + 21 |
| බර වැඩ ටයර් 28''x1½'' ( එම ) | 1 | 9·25 | 10·75 | + 16 |
| මූට්ටු රහිත ටියුබ 26''x1⅜'' ( එම ) | 1 | 3·70 | 3·95 | + 7 |
| මහන මැෂින් (266 එච්/55 සිංගර්) | 1 | 668·00 | 808·15 | + 21 |
| මහන මැෂින් (273 එම්./1 ඩබ්. සිංගර්) | 1 | 1145·40 | 1285·40 | + 12 |
| සෙන්ට්‍රික් පිස්ටන් පොම්ප ¾'' (පී.බී /1 ) | 1 | 970·00 | 1211·00 | + 25 |
| සෙන්ට්‍රික් කර්මාන්ත පොම්ප 1¼'' (140/1 ) | 1 | 1373·00 | 1609·00 | + 17 |
| සෙන්ට්‍රික් කෘෂිකර්මාන්ත පොම්ප 2'' (ඊකේජේ) | 1 | 1476·06 | 1706·00 | + 16 |
| පංකා (මේස) පොපියුලර් 36'' ඩබ/එල් | 1 | 363·00 | 531·00 | + 46 |
| පංකා (සිටුවනය සහිත) 16'' | 1 | 529·00 | 604·00 | + 14 |
| **7· කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය** | | | | |
| විශේෂ එළවළු පොහොර (නො. 1) | ටොන් 1 ක් | 489·58 | 524·16 | + 7 |
| විශේෂ වී පොහොර මිශ්‍රණය | ,, | 577·50 | 642·16 | + 11 |
| මියුරියෙට් ඔප් පොටෑෂ් (60%) | ,, | 633·33 | 728·33 | + 15 |
| යූරියා | ,, | 753·33 | 865·00 | + 15 |
| ඇමෝනියා සල්ෆේට් | ,, | 543·75 | 572·50 | + 5 |
| ෆොස්ෆේට් පොස්පේට් | ,, | 413·75 | 420·83 | + 2 |
| ඇග්‍රෝ රසායනය (ඩී. ඩී. ටී 25% ඊ. සී) | ගැ. 1 | 16·92 | 19·35 | + 14 |
| එම (ට්‍රිතියන් 2 ඊ) | ,, | 108·00 | 108·00 | — |
| රබර් සැකසුම් තෙල් (එල්) | ,, | 10·08 | 17·19 | + 71 |
| **8· ද්‍රව සහ ගොඩනැගිලි ද්‍රව්‍ය** | | | | |
| පිලි තහඩු | වර්ග අඩියක් | 0 90 | 1·14 | + 27 |
| පැතලි තහඩු | ,, | 0·56 | 0·77 | + 38 |
| සිමෙන්ති (කන්කසන්තුරේ) | හො. 1 ක් | 10·50 | 12·00 | + 14 |
| සිමෙන්ති (රුහුණු) | ,, | 12·00 | 13·00 | + 8 |
| සිමෙන්ති (තම්මැන්නා) | ,, | 11·25 | 12·50 | + 11 |
| **9· විවිධ** | | | | |
| විදුලි පන්දම් බැටරි | 1 | 0·64 | 0·83 | + 30 |
| ට්‍රාන්සිස්ටර් බැටරි | 1 | 0·67 | 0·93 | + 39 |
| ගුවන් විදුලි බැටරි | 1 | 32·00 | 33·50 | + 5 |
| ඔටෝ මෝටර් බැටරි 6 වී. 60 ඇම්පියස් | 1 | 100·00 | 150·00 | + 50 |
| ඔටෝ මෝටර් ,, 12 වී. 60 ,, | 1 | 166·00 | 245·00 | + 48 |
| ලියන කඩදාසි ( ක්‍රීම්ලෙයිඩ) | 500 ක් | 43·20 | 43·20 | — |
| යතුරු ලියන කාබන් 8''x10'' | පෙට්ටි 1 ක් | 14·00 | 16·00 | + 14 |
| බිම් පොලිෂ් (රොනුක්ස්) | රා. 1 වින් | 4·00 | 5·65 | + 41 |
| කාර් වැක්ස් | රා. ½ වින් | 4·75 | 6·80 | + 43 |
| ගිනි පෙට්ටි | පෙට්ටි 7200 ක් | 340·00 | 472·00 | + 39 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 2. වැටුප්

මහ බැංකුව විසින් රාජ්‍ය අංශයේ, කාර්මික හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන් සඳහා සකස් කරනු ලබන වැටුප් අනුපාතික දර්ශකයන්, නියෝජිත පරිමාණයන්හි සේවකයන්ට ගෙවිය යුතු අවම වැටුප් වේතන හා දීමනා මත පදනම්වී ඇත. එහෙයින් අතිකාල හා වැඩිවීම් දීමනා ඇතුළත් කර නොමැත. පෞද්ගලික අංශයේ පඩි පාලක සභා පාලනයට නතු වන, කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කටයුතුවල නියුතු සේවකයන් සඳහා වැටුප් අනුපාතික දර්ශකයන්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. වැටුප් පාලක සභා විසින් නියම කෙරෙන අවම වැටුප් අනුපාතික මත මෙකී දර්ශකයන් පදනම්වී ඇති අතර, 1967 දෙසැම්බර් මාසයේ සිට "අවප්‍රමාණ දීමනාව" ද ඊට ඇතුළත්වෙයි

මෙහි සඳහන් වැටුප් අනුපාතික දර්ශකවල, අතිකාල දීමනා ඇතුළත් වන නියම ඉපැයුම් සහ පෞද්ගලික අංශයේ සානුබල හෝ පාරිතෝෂිකයන් වැනි විශේෂ දීමනා නියෝජනය නොකරන බව සැලකිල්ලට ගත යුතු වෙයි. මූර්ත වැටුප් අනුපාතික දර්ශක මහ බැංකුව විසින් ගණන් බලනු ලබන්නේ, කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන්, වැටුප් අනුපාතික දර්ශකයන් අවධමනය කිරීමෙනි.

II (එ) 4 වන සංඛ්‍යා සටහනින්, 1972 සහ 1973 සඳහා රජයේ සේවකයන්ගේ වාර්ෂික හා ත්‍රෛමාසික වැටුප් අනුපාතික හා මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන් දැක්වෙයි

### II (එ) 4 සංඛ්‍යා සටහන
### රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශකාංක
### (1952 = 100)

| | කාර්මික හා ලිපිකාර සේවකයෝ | | සුළු සේවකයෝ | | රජයේ සේවකයෝ (අ) | | රජයේ පාසැල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| **1972** | | | | | | | | |
| සාමාන්‍යය .. | **157·4** | **104·4** | **183·4** | **121·6** | **171·7** | **113·8** | **141·2** | **93·6** |
| පළමු කාර්තුව .. | 157·2 | 106·2 | 182·9 | 123·5 | 171·3 | 115·7 | 141·1 | 95·3 |
| දෙවන කාර්තුව .. | 157·2 | 104·6 | 182·9 | 121·7 | 171·3 | 114·0 | 141·1 | 93·9 |
| තුන්වන කාර්තුව .. | 157·2 | 103·3 | 182·9 | 120·2 | 171·3 | 112·6 | 141·1 | 92·7 |
| සතරවන කාර්තුව .. | 158·2 | 103·4 | 185·2 | 121·0 | 173·0 | 113·1 | 141·5 | 93·5 |
| **1973** | | | | | | | | |
| සාමාන්‍යය .. | **163·0** | **98·6** | **194·2** | **117·5** | **180·1** | **108·8** | **144·3** | **87·3** |
| පළමු කාර්තුව .. | 160·2 | 101·6 | 189·9 | 120·4 | 176·5 | 111·9 | 142·4 | 90·3 |
| දෙවන කාර්තුව .. | 160·2 | 99·3 | 189·9 | 117·7 | 176·5 | 108·7 | 142·4 | 88·3 |
| තුන්වන කාර්තුව .. | 160·2 | 95·5 | 189·9 | 113·2 | 176·5 | 105·2 | 142·4 | 84·9 |
| සතරවන කාර්තුව .. | 171·3 | 98·0 | 207·2 | 118·6 | 190·9 | 109·3 | 149·8 | 85·7 |
| 1972 ට වඩා 1973 ප්‍රතිශත වෙනස | +3·6 | −5·6 | +5·9 | −3·4 | +4·9 | −4·4 | +2·2 | −6·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ලිපිකාර හා කාර්මික සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

සංලක්ෂ්‍යය: 1959 සැප්තැම්බර් 30 වැනිදට සේවයෙහි යෙදී සිටි සේවක සංඛ්‍යාවන් මත පදනම්වූ නිශ්චිත බර තැබීම් මත මෙම දර්ශකාංකයන් ගණනය කර ඇත. දර්ශකාංකයන් ගණනය කිරීමේදී යොදගෙන ඇති වැටුප් අනුපාතිකයන් වනුයේ, එක් එක් නියෝජන පරිමාණවෙහි වූ මූලික වැටුප් සහ දීමනාවන්ය.

සියලුම ගණවල සේවකයන්ගේ වාර්ෂික සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශක 1972 දී පැවැති සාමාන්‍යයට වඩා වැඩිවී ඇත. කාර්මික හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන් සඳහා සම්බන්ධ දර්ශක අනුපාතිකයන් පිළිවෙලින් සියයට 3·6 කින්, 5·9 කින් හා 2·2 කින් වැඩි විය.

අවුරුදු 3 කට පමණ පසු 1972 දෙසැම්බර් මාසයේ සිට අය වැය යෝජනාවට අනුකූලව, රුපියල් 250 කට නොවැඩි මාසික වේතනයක් ලබන සේවකයනට ගෙවන ලද "විශේෂ දීමනාවක" ප්‍රතිඵලයක් වශයෙන් රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතිකයන්හි වැඩිවීමක් ඇති විය නැවත 1973 ඔක්තෝබර් 1 වැනි දින සිට රුපියල් 400 කට නොවැඩි මාසික වේතනයක් ලබන රජයේ සේවකයන්ට ගෙවන ලද රුපියල් 20 නොඉක්මවන, වැටුපෙන් සියයට 10 ක විශේෂ දීමනාවක් නිසා ඔවුන්ගේ වැටුප් අනුපාතිකයන් තවදුරටත් වැඩි විය.

කෙසේ වුවද, රජයේ සේවකයන්ගේ මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන් 1973 දී පහළ වැටුනි. ලිපිකාර සේවකයන්ගේ, සුළු සේවකයන්ගේ සහ රජයේ පාසැල් ගුරුවරුන්ගේ දර්ශකයන් පිළිවෙලින් සියයට 5·6 කින්, 3·4 කින් සහ 6·7 කින් පහළ වැටුනි.

පෞද්ගලික අංශයේ, ඇතැම් වැටුප් පාලක සභා පාලනයට නතු වන සේවකයන් සම්බන්ධව 1972 හා 1973 සඳහා වාර්ෂික හා ත්‍රෛමාසික අවම වැටුප් අනුපාතික දර්ශක II (එ) 5 සංඛ්‍යා සටහනින් දක්වෙයි.

## II (එ) 5 සංඛ්‍යා සටහන

### වැටුප් පාලක සභා කර්මාන්තයන්හි සේවකයන් සඳහා අවම වැටුප් අනුපාතික දර්ශකාංක. (1952 = 100)

| | කෘෂිකර්මාන්තයෙහි නියුතු සේවකයෝ (අ) | | වාණිජ හා කර්මාන්ත කටයුතුවල නියුතු සේවකයෝ (ආ) | | පඩි පාලක සභාවලට නතුවන කර්මාන්තයන්හි නියුතු සේවකයෝ (ඇ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1972 සාමාන්‍යය .. | 148·5 | 98·4 | 181·4 | 120·3 | 156·9 | 100·7 |
| පළමු කාර්තුව .. | 145·6 | 98·3 | 180·5 | 121·9 | 149·2 | 100·8 |
| දෙවන කාර්තුව .. | 146·3 | 97·3 | 181·1 | 120·5 | 149·8 | 99·7 |
| තෙවන කාර්තුව .. | 148·5 | 97·6 | 181·9 | 119·5 | 152·0 | 99·9 |
| සතරවන කාර්තුව .. | 153·6 | 100·3 | 182·5 | 119·3 | 156·5 | 102·3 |
| 1973 සාමාන්‍යය .. | 168·1 | 101·5 | 199·7 | 120·7 | 169·9 | 102·7 |
| පළමු කාර්තුව .. | 158·8 | 100·7 | 191·7 | 121·5 | 162·1 | 102·8 |
| දෙවන කාර්තුව .. | 160·4 | 99·4 | 194·0 | 120·2 | 163·9 | 101·5 |
| තෙවන කාර්තුව .. | 165·7 | 98·4 | 196·0 | 116·8 | 168·6 | 100·5 |
| සතරවන කාර්තුව .. | 187·4 | 107·3 | 217·4 | 124·4 | 184·6 | 105·7 |
| 1972 ට වඩා 1973 ප්‍රතිශත වෙනස | + 13·2 | + 3·2 | +10·1 | + 0·3 | + 8·3 | + 2·0 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය සහ පොල් වගා කර්මාන්ත පමණක් අඩංගු වේ.

(ආ) පොල් නිෂ්පාදනය, ඉංජිනේරු, මුද්‍රණ කටයුතු, ගිනිපෙට්ටි නිෂ්පාදනය, මෝටර් රථ ප්‍රවාහනය, නැව් තටාක, වරාය, වරාය ප්‍රවාහණ, තේ අපනයන, රබර් අපනයන සිනමා සහ ගොඩනැගිලි කර්මාන්තයන් පමණක් අඩංගු වේ.

(ඇ) කෘෂිකාර්මික සේවකයන් සහ වාණිජ හා කාර්මික සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය

1973 දී පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වාර්ෂික හා ත්‍රෛමාසික සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශක, ඉකුත් වර්ෂයේ දර්ශකවලට වඩා වැඩිවී ඇත. කෘෂිකාර්මික කටයුතුවල නියුතු සේවකයන් සඳහා වූ දර්ශකයෙහි සියයට 13·2 ක වැඩිවීමක් සටහන් වූ අතර, කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුතු සේවකයන් සඳහා වන දර්ශකයෙහි සියයට 10·1 ක වැඩිවීමක් සටහන් විය.

දර්ශකයන්හි වැඩිවීම් සිදුවූයේ වැටුප් පාලක සභා යටතේ ඇතුළත් වී ඇති කම්කරුවන්ගේ වැටුප් සඳහා සකස් කළ මිළ වැඩිවීම් පිළිබඳ වන්දි ගෙවීමේ ක්‍රමය හේතුකොට ගෙන සහ පෞද්ගලික අංශයේ මසකට රුපියල් 400 කට වඩා අඩු වේතනයක් ලබන සේවකයන්ට රුපියල් 20 ක උපරිමයට අනුව සියයට 10 ක විශේෂ දීමනාවක් ගෙවීම හේතුකොට ගෙනය.

කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කටයුතුවල නියුතු සේවකයන් සහ වැටුප් පාලක සභා යටතට ගැනෙන වෘත්තීන්හි නියුතු සේවකයන් සඳහා වූ වාර්ෂික සාමාන්‍ය මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන් 1973 දී පිළිවෙලින් සියයට 3·2 කින්, සියයට 0 3 කින් සහ සියයට 2·0 කින් ඉහළ යන ලදී.

වසර තුළදී වෙළඳ කර්මාන්ත තුනක සේවකයනට අදළ අවම වැටුප්, වැඩිවීම් සමඟ ඒකාබද්ධ කරන ලදී. ඒවා නම්,

(අ) පොල් නිෂ්පාදන කර්මාන්තය:- 1973 ජනවාරි මස 1 වෙනි දින සිට බලපවත්වන අන්දමින් දිනකට රුපියල් 1.75 ක වැඩිවීමක්,

(ආ) ගොඩනැගිලි කර්මාන්තය:- 1973 මාර්තු 1 වෙනි දින සිට බලපවත්වන අන්දමින් දිනකට රුපියල් 1.50 ක වැඩිවීමක්,

(ඇ) අයිස් සහ සිසිල් බීම නිෂ්පාදන කර්මාන්තය:- 1973 නොවැම්බර් 1 වෙනි දින සිට බලපවත් වන අන්දමින් දිනකට රුපියල් 2.00 ක පමණ වැඩිවීමක් වශයෙනි.

නුපුහුණු සේවකයන් සියයකට නොඅඩු ගණනක් සේවයේ යොදවන රෙදිපිළි නිෂ්පාදකයන් විසින් එකී සේවකයන් මසකට අඩු වශයෙන් දින 25 ක් වැඩ කරනු ලැබුවේ නම් එක් අයෙකු සඳහා මසකට රුපියල් 180 ක අවම වැටුප් අනුපාතිකයක් ගෙවිය යුතු විය. 1973 දෙසැම්බර් මස 1 වන දින සිට මෙය බලපැවැත්විය.

1973 ජූනි මස දුව සහ වඩු වැඩ කර්මාන්තයන්හි නියුතු සේවකයන් සඳහා වැටුප් පාලක සභාවක් පිහිටුවනු ලැබූ අතර වැටුප් පාලක සභාවන්ගේ මුළු සංඛ්‍යාව 33 දක්වා වැඩි විය.